**ජාතික විද්‍යා පදනම.**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍යය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පාරිතෝෂික ප්‍රතිපාදනය රු.997,731 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.2.2 නොසැසඳුන පාලන ගිණුම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව තොග ශේෂයේ ඇතුළත් පොත්, දැන්වීම් හා කැසට් පට තොගයේ වටිනාකම රු.2,973,545 ක් වුවද, තොග ලේඛන අනුව එය රු.8,424,493 ක් වී තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් | 370,000,000 | ඉඩමේ හිමිකම් ඔප්පුව |
| ස්ථාවර වත්කම්<br>(ගොඩනැගිලි හැර) | 91,889,626 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| විද්‍යා හා පර්යේෂණ තොග | 4,263,546 | - එම - |
| උපකරණ ප්‍රදාන | 5,004,103 | උපලේඛන |

1.2.4 ලැබිය යුතු මුදල්

පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලබා දුන් රු.859,201 ක් වූ අත්තිකාරම් වසරකට වැඩි කාලයක් නොපියවා තිබුණි.

1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව වයස අවුරුදු 60 ට වැඩි විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකු උපදේශක සේවයේ යොදවා වැටුප් හා ප්‍රවාහන දීමනා ලෙස රු.1.088,998 ක් ගෙවීම් කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.8,247,108 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,658,685 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.3,588,423 ක පිරිහීම සඳහා රජයේ ප්‍රදාන රුපියල් මිලියන 07 කින් වැඩිවී තිබියදී මුළු වියදම රුපියල් මිලියන 10 කින් වැඩිවීම බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) ආයතනය විසින් 2012 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා තථ්‍ය කාර්යසාධනය අතර සැසඳීමක් පහත දැක්වේ.

| වර්ෂය | නිමකළ පර්යේෂණ ගණන | පසු විපරම් කටයුතු සඳහා තාක්ෂණ අංශය වෙත යවන ලද ප්‍රමාණය | පසු විපරම්වලට ලක් නොවූ පර්යේෂණ | ඉදිරියට ගෙන යා හැකි පර්යේෂණ |
|---|---|---|---|---|
| 2010 | 42 | 39 | 03 | - |
| 2011 | 37 | 17 | 20 | 09 |

(ආ) පසුගිය වර්ෂ කීපයක් තුළ පසුවිපරම් කිරීම සඳහා තාක්ෂණ අංශය වෙත යොමු කර තිබූ පර්යේෂණ වාර්තා පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| වර්ෂය | නිමකළ පර්යේෂණය ප්‍රකාශනයක් ලෙස යොදා ගැනීම | පේටන්ට් අයදුම් කිරීමට හැකියාව ඇති පර්යේෂණ | වාණිජ ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කළහැකි පර්යේෂණ | තවදුරටත් පර්යේෂණ සිදුකිරීම සඳහා යොමු කළහැකි පර්යේෂණ | මුල් ආකෘතිය පදනම් කරගෙන සංවර්ධනය කළහැකි ව්‍යාපෘති | පේටන්ට් ලබා ගැනීම |
|---|---|---|---|---|---|---|
| 2008 | 15 | 01 | - | 10 | - | - |
| 2009 | 16 | 02 | 01 | 05 | 02 | - |
| 2010 | 02 | 02 | 03 | 02 | 05 | 02 |
| 2011 | 01 | 01 | - | 13 | 08 | - |

3.2 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2008 වර්ෂයේදී නිෂ්පාදිත රු.83,800 ක් වටිනා මිහිමඩල සංයුක්ත තැටි 797 ක් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ). අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව පොත් මුද්‍රණය කිරීම නිසා රු.8,424,493 ක් වූ නිකුත් නොවන පොත් 12,394 ක් ගබඩාවේ නිෂ්ක්‍රියව පැවතුණි.

3.3 ප්‍රමාදවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක පාසැල සමඟ ජාතික විද්‍යා පදනම 2011 පෙබරවාරි 15 වන දින රු.2,999,000 ක ගිවිසුමකට එළඹී තිබුණි. 2013 මාර්තු 31 වන විටත් එම කාර්යය නිමකර නොතිබුණි.

(ආ). උතුරු මැද, ඌව සහ නැගෙනහිර පළාත්වල උග්‍ර වකුගඩු රෝග ඇතිවීමට හේතු හඳුනා ගැනීම පිළිබඳව ජගත් සෞඛ්‍ය සංවිධානය විසින් සම්බන්ධීකරණය කරනු ලබන බහු ශික්ෂණ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 70 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර, 2013 මාර්තු 31 වන විටත් එම පර්යේෂණ ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.

(ඇ). බහු ශික්ෂණ ව්‍යාපෘතියේ අරමුදල් යෙදවීම පිළිබඳව අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා විද්‍යා පදනම වෙත ලබාදී නොතිබුණු අතර, බාහිර විගණක පිළිබඳ තොරතුරු ජාතික විද්‍යා පදනම විසින් හඳුනාගෙන නොතිබුණි.

3.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ජාතික විද්‍යා පදනමේ කළමනාකාර සහකාර තනතුර සඳහා බඳවාගත් නිලධාරිණියන් දෙදෙනෙක් ජ්‍යෝෂ්ඨ අමාත්‍ය කාර්යාලයට මුදාහැර තිබුණි.

(ආ). තාක්ෂණ පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවයේ යොදවා ඇති උපගුරු තනතුරක් දරන නිලධාරියෙකුට 2011 මැයි 01 දින සිට වැටුප් වශයෙන් රු.675,395 ක් ජාතික විද්‍යා පදනමෙන් ගෙවා තිබුණි.

4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණ වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ). පර්යේෂණ ප්‍රදාන.
(ආ). තොග පාලනය.